// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/55 - 2016 මැයි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2016.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ජාතික ක්‍රීඩා සංගම් නියෝග මාලාවේ 54(3) වැනි වගන්තිය යටතේ විධානය

ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර වන මා විසින් ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ අතුරුපාලක කමිටු කාලසීමාව 2015.07.15 වන දිනෙන් අවසන් වී ඇති බැවින් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වැනි වගන්තිය යටතේ 2013 අගෝස්තු මස 30 වන දින ප්‍රකාශයට පත්කරන ලදුව අංක 1825/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 54(3) වගන්තිය යටතේ සඳහන් වන ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ රෙගුලාසි ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව සහ 2015 සැප්තැම්බර් මස 16 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව 2016 මැයි මස 20 වැනි පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ නිලවරණයේදී ක්‍රීඩා සමාජ විසින් බලය පැවරීමේ ලිපි සෘජුවම ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියමිත කාලය තුළ ලබාදීමට අපොහොසත්වීම මගින් නිලවරණයේදී සිදුවිය හැකි අගතීන් ඉවත් කිරීමත් ජූඩෝ ක්‍රීඩාවේ උන්නතිය උදෙසා සියලුම ක්‍රීඩා සමාජවල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම සාක්ෂාත් කිරීමත් සැලකිල්ලට ගනිමින් එම නිලවරණය අවලංගු කොට නැවත වතාවක් ශ්‍රී ලංකා ජූඩෝ සංගමයේ නව නිලධාරී මණ්ඩලය තෝරාගැනීමේ නිලවරණය කැඳවීමට හා පැවැත්වීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වන කලුදුර ශාන්ත රුවන්චන්ද්‍ර ද සිල්වා මහතාට මෙයින් නියම කරමි.

නීතිඥ දයාසිරි ජයසේකර,
ක්‍රීඩා අමාත්‍ය.

2016 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

06 - 150

1A - G 23497 — 17 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*